04 ඒකකය - සාධක හා ගුණාකාර(2)

✓ සංඛ්‍යාවක් 6න් බෙදේ දැයි පරීක්ෂා කිරීම

ක්‍රියාකාරකම 3

පහත සඳහන් වගුව සම්පූර්ණ කර, අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

සංඛ්‍යාව	එම සංඛ්‍යාව 2න් බෙදේ ද?	එම සංඛ්‍යාව 3න් බෙදේ ද?	සංඛ්‍යාව 6න් බෙදේ ද?	6, එම සංඛ්‍යාවේ සාධකයක් වේද?
95				
252				
506				
432				
552				
1236				

(i) 6න් බෙදෙන සංඛ්‍යා සියල්ල 2න් බෙදේ ද?
(ii) 6න් බෙදෙන සංඛ්‍යා සියල්ල 3න් බෙදේ ද?
(iii) 6න් බෙදෙන සංඛ්‍යා සියල්ල 2න් හා 3න් බෙදේ ද?
(iv) 6න් බෙදෙන සංඛ්‍යා හඳුනා ගැනීම සඳහා සුදුසු ක්‍රමයක් යෝජනා කරන්න.

සංඛ්‍යාවක් 2න් සහ 3න් බෙදේ නම්, එම සංඛ්‍යාව 6න් බෙදේ. එනම්, 6 එම සංඛ්‍යාවේ සාධකයක් වේ.

✓ සංඛ්‍යාවක් 4න් බෙදේ දැයි පරීක්ෂා කිරීම

ක්‍රියාකාරකම 4

පහත සඳහන් වගුව සම්පූර්ණ කර, අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

සංඛ්‍යාව	එකස්ථානයේ ඉලක්කම 4න් බෙදේ ද?	අග ඉලක්කම් දෙක මඟින් ලැබෙන සංඛ්‍යාව 4න් බෙදේ ද?	සංඛ්‍යාව 4න් බෙදේ ද?	4, එම සංඛ්‍යාවේ සාධකයක් වේද?
36				
259				
244				
600				
1272				
4828				

(i) 4න් බෙදෙන සෑම සංඛ්‍යාවක ම එකස්ථානයේ ඉලක්කම 4න් බෙදේ ද?
(ii) 4න් බෙදෙන සෑම සංඛ්‍යාවක ම අග ඉලක්කම් දෙකෙන් ලැබෙන සංඛ්‍යාව 4න් බෙදේ ද?
(iii) සංඛ්‍යාවක් 4න් බෙදේ දැයි පරීක්ෂා කිරීමට යොදා ගත යුත්තේ ඉහත ලක්ෂණ අතුරින් කවර ලක්ෂණය ද?

ඉලක්කම් දෙකක් හෝ ඊට වැඩියෙන් ඇති පූර්ණ සංඛ්‍යාවක අග ඉලක්කම් දෙකෙන් සෑදුණ සංඛ්‍යාව 4න් බෙදේ නම් එම සංඛ්‍යාව 4න් බෙදේ. එනම්, 4 එම සංඛ්‍යාවේ සාධකයක් වේ.

➢ ඔබේ ගණිතය පෙළ පොතෙහි **4.2** අභ්‍යාසය සම්පූර්ණ කරන්න.